ඇමුණුම 01

# පරිසර නියමු ජනාධිපති පදක්කම්ලාභීන්ගේ ඉන්දීය සංචාරය - 2017

## තෝරා ගැනීමේ නිර්ණායක

<u>පරිසර නියමුවන්</u>

1. පරිසර නියමුවා, අදාළ වර්ෂයේ පරිසර නියමු ජනාධිපති පදක්කම්ලාභී සිසුවෙකු විය යුතුය.
2. සංචාරයට සහභාගිවන සිසුවා, අනිවාර්යයෙන්ම පාසල් සිසුවෙකු විය යුතුය.
3. අ.පො.ස. උසස්පෙළ දෙවනිවර පෙනී සිටීමට පෙර පදක්කම් පරීක්ෂණය සමත් වී සිටිය යුතුය.

<u>ගුරුවරුන්</u>

1. අදාළ වර්ෂයේ පරිසර නියමු ජනාධිපති පදක්කම්ලාභීන් 05ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් බිහිකළ යුතුය.
2. එක් ගුරුවරයෙකුට වසර 5කට වරක් පමණක් අවස්ථාව ලැබේ.
3. වසර 5කට අඩු කාලයක දී එම ගුරුවරයාට නැවත අවස්ථාව ලැබේ නම් ඒ සඳහා එම විදුහලේ පරිසර නියමු වැඩසටහනට දායකවන වෙනත් ගුරුවරයෙකුට හෝ විදුහල්පතිට අවස්ථාව ලැබේ.

<u>පරිසර නිලධාරීන්</u>

1. අදාළ වර්ෂයේ ජනාධිපති පදක්කම්ලාභීන් 05ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් බිහිකළ ප්‍රාදේශිය පරිසර නිලධාරියෙකු විය යුතුය.
2. එක් නිලධාරියෙකුට වසර 5කට වරක් පමණක් අවස්ථාව ලැබේ.
3. වසර 5ට වඩා අඩු කාලයක දී එම නිලධාරියාට නැවත අවස්ථාව ලැබේ නම් එම අවස්ථාව පරිසර නියමු වැඩසටහනට සක්‍රීයව දායකවන එම කාර්යාලයේ වෙනත් නිලධාරියෙකුට ලබාදීම අදාළ පළාත් කාර්යාලය විසින් කළ යුතුය.

<u>දිස්ත්‍රික් කාර්යාලවල ජොෂ්ඨ නිලධාරීන්</u>

1. අදාළ වර්ෂය තුළ වැඩිම පදක්කම්ලාභීන් බිහිකළ දිස්ත්‍රික් කාර්යාලයේ ජොෂ්ඨ නිලධාරියෙකු වීම.

<u>ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්</u>

1. පරිසර නියමු වැඩසටහන සඳහා සහ ජනාධිපති පදක්කම් ක්‍රියාවලිය සඳහා සක්‍රීයව සහභාගිවන නිලධාරීන්
   (ප්‍රධාන කාර්යාලයෙන් සහභාගිවන සංඛ්‍යාව තීරණය වන්නේ, චාරිකාව සඳහා සහභාගිවන අනෙකුත් සහභාගී වන්නන්ගේ සංඛ්‍යාව අනුවයි).